# සම සමාජ ජාතික සන්ධානයේ ප්‍රතිපත්ති ප්‍රකාශය

කිර්ති වික්‍රමරත්න



- **‘සාගින්න දුරු කරමු’**
  **දරුවන්ගේ බඩගින්න දුරු කරන අඩු වියදම් දේශීය යාන්ත්‍රණය අපෙන්.**

- **‘සාධාරණ වැටුපක්’**
  **සියලුම රජයේ සේවකයින්ට සුවසේ ජීවත් විය හැකි සාධාරණ වැටුපක්.**

- **‘පුද්ගලික බදු බර නැති හෙටක්’**
  **රටේ සුවිශේෂී ඩොලර් උත්පාදනයක් මගින් පෞද්ගලික බදු නැති කිරීම.**

- **‘විදුලි බිලක් නැති හෙටක් ’**
  **සැමට පුනර්ජනනීය බල ශක්තිය දෙන ක්‍රමවේදයක්ට ඇති කිරීම.**

- **‘ඛනිජ සම්පතින් ණය ගෙවමු’**
  **ඛනිජ සම්පත් ආශ්‍රිත කර්මාන්ත තුලින් වසර තුනක කඩිනම් හා දැවැන්ත වැඩ පිළිවෙළක් මගින් ප්‍රවර්ධනය කොට ණය ගෙවීම.**

- **‘නව රැකියා 250,000 ක්’**
  **දෙස් විදෙස් වෙළඳපලේ ඉහල වැටුප් ලැබෙන රැකියා බිහිකිරීම.**

- **‘දරුවන්ට හා කාන්තාවන්ට සුරක්ෂිත අනාගතයක්’**
  **දරුවන්ට රැකවරන හා කාන්තාවන්ට නිසි වැටුප් ලබාදීමෙන් ඔවුන් සාධාරණය හා සුරක්ශිත භාවය ලබාදීම.**

- **‘ලොව විශාලතම ආලෝක පූජාව’**
  **සැම ආගමික ස්ථානයකට ම නොමිලේ සෝලා බලය මගින් විදුලිය ලබාදීම.**

- **‘ගමන බිමන හිරු එළියෙන්’**
  **ඔබේ වාහනයට EV battery තාක්ෂණය ලබාදීම.**

- **‘ලොව නැනෝ තාක්ෂණයට ග්‍රැෆීන් ලංකාවෙන්’**
  **‘ග්‍රැෆීන්’ වලින් රට පොහොසත් කිරීම.**

#KW

**දැක්ම:**

දේශීය සම්පත්, පුනර්ජනනීය බල ශක්තිය, දේශීය ඥානය හා නවීන තාක්ෂණය පරිසර හිතකාමී ලෙස යොදා ගනිමින් සිදු කරන නිෂ්පාදන ආර්ථිකයක් තුලින් ණය බරින් තොර නිරෝගී, සෞභාග්‍යමත් හා මනුෂ්‍යත්වය අගයන දේශයක් නිර්මාණය කිරීම

**මෙහෙවර:**

ඉහත සඳහන් දැක්ම ළඟා කර ගැනීම සඳහා දේශීය ඛනිජ සම්පත් ආශ්‍රිත කර්මාන්ත හා පරිසර හිතකාමී කෘෂිකර්මාන්තය පදනම් කර ගත් අපනයනයට ප්‍රමුඛත්වය දෙන නිවැරදි මිනිස් බල ක්‍රමසම්පාදනයක් සහිත ජාතික ආරක්ෂාව ප්‍රමුඛ කර ගත් සාධාරණ සමාජයක් ගොඩනැගීම සඳහා කටයුතු සම්පාදනය කිරීම

**පූර්විකාව:**

රටේ ණයගැති භාවය වසර 02 ක් තුල තුරන් කිරීම සඳහා නිවැරදි නිෂ්පාදන ආර්ථික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම තුලින් දේශීය විනිමය සංචිත ගොඩනැගීමත්, නිරෝගී, නිදහස් හා නිවහල් සමාජ සංස්කෘතියක් ස්ථාපිත කිරීමත් අප රජයේ මූලික ඉලක්කය වේ. දේශීය සම්පත් විදේශිකයන්ට නතු නො කිරීමටත් දේශීය අමුද්‍රව්‍ය භාවිතා කරන, අපනයන අභිමුඛ කර්මාන්ත ව්‍යවුහයක් ඇති කිරීමත්, වර්තමානයට ගැළපෙන නවීන කෘෂිකාර්මික ක්‍රම හඳුන්වා දීම තුලින් දේශීය ස්වයංපෝෂිත ආර්ථිකයක් ගොඩනැගීම අපගේ මුඛ්‍ය පරමාර්ථය වේ. මේ සඳහා ඒකීය රාජ්‍ය සංකල්පය ආරක්ෂා කරමින් දිස්ත්‍රික්ක සංවර්ධන සභා නැවත ස්ථාපිත කිරීමෙන් පාලන බලතල හා මූල්‍යනය විමධ්‍යගත කිරීමත් සුහුරු තාක්ෂණය හා කෘතිම බුද්ධිය වඩ වඩා යොදා ගනිමින් පුනර්ජනනීය බල ශක්ති භාවිතය ප්‍රචලිත කිරීමටත් අපි බලාපොරොත්තු වෙමු. මෙම අරමුණු ඉටු කර ගැනීම සඳහා පහත සඳහන් මූලික ප්‍රතිපත්ති අනුගමනය කිරීමෙන් නව දර්ශනයක් හඳුන්වා දීම තුළින් අප දේශය ගොඩ නංවා තිරසාර සංවර්ධනයක් ස්ථාපිත කරනු ඇත.

1. **කර්මාන්ත:**

දේශීය ඛනිජ සම්පත් හා අමුද්‍රව්‍ය භාවිතා කරමින් අගයෙන් වැඩි නිමි භාණ්ඩ නිෂ්පාදනය කිරීම හා ඒවා අපනයනය තුළින් රටේ විදෙස් සංචිත ශක්තිමත් කර රට ණයගැති භාවයෙන් නිදහස් කිරීම හා ණය රටට වාසි වන ආකාරයට ප්‍රතිව්‍යවුහගත කිරීම හරහා අන්තර්ජාතික මූල්‍ය අරමුදල මත යැපෙන්නේ නැති ආර්ථික ක්‍රියාදාමයක් ඇති කිරීම

**ශ්‍රී ලංකාවේ භූ සම්පත් ආශ්‍රිත කර්මාන්ත:**

භූ සම්පත් (සාගර සම්පත්ද ඇතුළුව) ගවේෂණය කිරීම, කැණීම් කිරීම, පර්යේෂණ කිරීම, අගය එකතු කළ නිෂ්පාදන සිදු කිරීම හා අපනයන කටයුතු ප්‍රවර්ධනය සඳහා පූර්ණ බලතල ඇති විද්වතුන්ගෙන් හා කර්මාන්ත කරුවන්ගෙන් සමන්විත මණ්ඩලයක් පත් කරනු ලැබේ. ලෝක වෙළඳපොළේ ඉහළ ම ඉල්ලුමක් ඇති විදෙස් විනිමය උපරිම ලෙස උපයා ගත හැකි ඛනිජ සම්පත් 05 ක් ප්‍රමුඛතාවයක් ලෙස සළකා රජයන් දෙකක් අතර ඇති කර ගන්නා ගිවිසුම් මත කෙටිකාලීන ඉලක්කගත නිෂ්පාදන, අපනයන සහ අලෙවිකරණ වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම.

**මිනිරන් ආශ්‍රිත කර්මාන්ත:**

මිනිරන් ආශ්‍රිත battery grade graphite, conductive graphite හා graphene වැනි සුවිශේෂ අගය එකතු කල නිෂ්පාදන ආශ්‍රිත නිමි භාණ්ඩ රාශියක් නිපදවා ලෝක වෙළඳපොළට ඉදිරිපත් කිරීම තුලින් විශිෂ්ට අපනයන ආර්ථිකයක් ගොඩ නැංවීමට බලාපොරොත්තු වේ. ලෝක වෙළඳපළේ

ලංකාවේ මිනිරන් ටොන් එකක් අලෙවි වන අවම මිල වන්නේ ඇ.ඩොලර් 2000 කි. ශ්‍රී ලංකාවේ අතීතයේ මිනිරන් පතල් 3,000ක් පමණ තිබී ඇති අතර ඉන් පතල් 1000 ක් විධිමත් ලෙස ක්‍රියාත්මක කර වසරකට මිනිරන් මෙ.ටොන් ලක්ෂ 03ක් අපනයනය කිරීමේ කඩිනම් සැලසුමක් අප සතුව ඇත. දළ වශයෙන් ගණන් බැලුවහොත් අගය එකතු කර (99.99 %) ටොන් එකක් ඇ.ඩොලර් 8000 බැගින් අලෙවි කර වසරකට ඇ.ඩොලර් මිලියන 2,400 ක අපනයන ආදායමක් විදේශ විනිමය ලෙස උපයා ගැනීමට හැකියාව ඇත. මීට වඩා අගය එකතු කිරීමේ තාක්ෂණය ද අප හට ඇත. ඒ අනුව අගය එකතු කල විට මෙ.ටොන් එකක අවම මිල ඇ.ඩොලර් 15,000 ඉක්මවනු ඇත. ඒ අනුව වාර්ෂික අපනයන ආදායම ඇ.ඩොලර් මිලියන 3,750 ඉක්මවනු ඇත. කෘත්‍රිම බුද්ධිය ආශ්‍රිත කර්මාන්ත වලට නැතිවම බැරි සුපිරි අර්ධ සන්නායකයක් වන 'ග්‍රැෆීන්' මෙ.ටොන් එකකට ඇ.ඩොලර් මිලියන 10ක් බැගින් විදෙස් ඉල්ලුම වන මාසයකට මෙ.ටොන් 100ක් අපනයනය කොට වසරකට ඇ.ඩොලර් බිලියන 12ක විදෙස් විනිමය උපයා ණය ගෙවන ක්‍රමය අප සතු වේ.

**මැණික් ආශ්‍රිත කර්මාන්ත:**

අමතරව, කඩිනම් ක්‍රමවේද යොදා ගනිමින් කැණීම් සිදු කිරීම හරහා නිල් මැණික් මෙ.ටො. 02 ක් අපනයනය කොට ණය බරින් රට මුදවා ගැනීමේ සැලසුම් ද ක්‍රියාවට නැංවෙනු ඇති. මැණික් විවිධ හැඩතල ගැන්වීම් (fantasy cuts) හා විවිධ ලෝහ ආධාරයෙන් වර්ණ ගැන්වීම් (treatment) ඇතුළු තාක්ෂණ ක්‍රමවේද තුළින් අගය එකතු කොට අපනයනයෙන් තවදුරටත් වැඩි විදේශ විනිමය උපයා ගැනීමට කටයුතු කෙරේ.

අධික විදේශ විනිමය වැය කර සූර්ය පැනල ආනයනය කරනවා වෙනුවට, ඊට අවශ්‍ය ඉතා උසස් තත්ත්වයේ සුදු තිරිවාණා(quartz) Asus වැනි සමාගම් වලට ලබා දී ඔවුන් හරහා සෝලා පැනල නිපදවා ගැනීම තුළින් විදෙස් විනිමය ඉතුරු කරමින්, අවම මුදලකට ශ්‍රී ලාංකිකයින්ට සෝලා පැනල ලබා දීම සඳහා දැනටමත් ගිවිසුම් ගත වීමේ හැකියාව පවතී.

**ලෝහ ආශ්‍රිත කර්මාන්ත:**

අනෙකුත් මෙවැනි වටිනා ඛනිජ සම්පත් ආශ්‍රිත කර්මාන්ත ද ප්‍රමුඛතාව සලකා සමූපකාර ක්‍රමවේදයට අනුව ප්‍රවර්ධනය කෙරේ. උදා: විකලාංග වෛද්‍ය ක්ෂේත්‍රයට අදාළ ජෛව වෛද්‍ය ඉංජිනේරු (Biomedical Engineering) ක්ෂේත්‍රයට අදාළ යෙදවුම්(applications) වශයෙන් භාවිතා වන ටයිටේනියම්(Titanium), කෘත්‍රිම සංධි(prostheses) සෑදීම, බද්ධ කිරීම් (implants) හා අස්ථි බිඳීම්වල දී භාවිතා වන ඇපටයිට්(Hydroxyapatite) වැනි ඛනිජ ආශ්‍රිත කර්මාන්ත කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ හැක. ඒ සඳහා අපේ රටට ගැළපෙන ලෙස නවෝත්පාදන (custom made innovations) බිහි කිරීම පිළිබඳ පර්යේෂණ සංස්කෘතියක් (research culture) ඇති කොට ඒ ආශ්‍රිත කර්මාන්ත ඇති කිරීම තුළින් ඉතා විශාල මුදලක් අනවශ්‍ය ලෙස පිට රටට යාම වැළැක්වීමටත්, නව රැකියා උත්පාදනයටත් අවස්ථාව සැලසේ.

**අනෙකුත් කර්මාන්ත:**

පොල්, තේ, රබර් ආශ්‍රිත කර්මාන්ත වර්තමානයට ගැළපෙන ලෙස වැඩි දියුණු කිරීමට ද අපේක්ෂිතයි. ශ්‍රී ලංකාවේ පේෂ කර්මාන්තය, පොහොර, කඩදාසි, සීනි ආශ්‍රිත නව කර්මාන්තශාලා මෙන්ම වැඩි දෙනෙකුට රැකියා ලැබෙන පරිදි ගෘහාශ්‍රිත කර්මාන්ත ඇති කිරීමට යෝජිතයි.

2. **බලශක්තිය:**

ඩීසල්, ගෑස් හා ගල් අඟුරු සඳහා විශාල වශයෙන් විදෙස් විනිමය පිටරටට ගලා යාම නැවැත්වීම සඳහා පුනර්ජනනීය බලශක්ති (සුළං, ජල, සූර්ය, භූගත තාප හා මුහුදු ජල තරංග බලය) භාවිතා කිරීම හැකි තරම් වැඩි කිරීම තුළින් නිෂ්පාදන වියදම අඩු කිරීමත්, දැනට පවතින අධික විදුලි බිල් අඩු කිරීම තුළින් ජීවන වියදම අඩු කිරීමත්, රටේ පවතින ඉතා ඉහල ප්‍රවාහන වියදම් අඩු කිරීමත්,

මෙම පුනර්ජනනීය බල ශක්තිය තුළින් ලබා කර ගැනීම. දැනටමත් ‘සූර්ය බල සංග්‍රාමය’ හරහා මෙගාවොට් 1000ක සූර්ය බල ශක්තියක් ප්‍රධාන විදුලි බල ප්‍රවාහයට එක් කර දීම සඳහා මූලිකත්වය ගනිමින් වසරකට රුපියල් බිලියන 125 ක් බැගින් රටට ඉතිරි කර දීම සිදු කොට අවසන් ය. ‘ආලෝක පූජා’ සංකල්පය යටතේ සියලු පූජනීය ස්ථාන වලට නොමිලේ විදුලි බලය ලබා දීම හා ‘සැමට සෝලා’සංකල්පය යටතේ සමෘද්ධිලාභීන්ට හා අනෙකුත් රාජ්‍ය හා රාජ්‍ය නොවන සේවකයන් සඳහා ඉතාමත් අඩු මිලට සූර්ය බලශක්තිය ඇතුළු පුනර්ජනනීය බල ශක්තිය ලබා දීම. ‘ගමන-බිමන හිරු එළියෙන්’ සංකල්පය යටතේ කාර්, බස්, ත්‍රී වීල් හා යතුරුපැදි සඳහා EV බැටරි තාක්ෂණය හඳුන්වා දීම.

## 3. ආහාර සුරක්ෂිතතාවය:

රටේ මොනයම් පුද්ගලයෙකු හෝ මින් ඉදිරියට ආහාර අහේනියට හෝ සාගින්නට ලක් වීමට ඉඩ නො තැබීම සහතික කරනු වස් රටට හා අදට ගැළපෙන දේශීය හා නවීන තාක්ෂණය පදනම් කර ගත් වස විසෙන් තොර ආහාර හා පෝෂණ සංස්කෘතියක් ගොඩනැගීම. ඒ අනුව, අධික විවිධත්වයකින් යුතු, පෝෂණ ගුණ, ක්‍රියාකාරී ගුණ හා ඖෂධීය ගුණ අතින් ඉහළ, කාලගුණ විපර්යාසයන්ට හා ජෛව-අජෛව ආතතීන්ට ප්‍රතිරෝධී, අවම යෙදවුම් මත පදනම් වන පරිසර හිතකාමී ආහාර නිෂ්පාදන ක්‍රියාවලියකට ප්‍රමුඛත්වය ලබා දේ. මෙහි දී, වර්තමානයේ ඌන භාවිත එහෙත් අතීතයේ භාවිතා කළ 3,300 ඉක්මවූ ධාන්‍ය, අල වර්ග, එළවලු, පලතුරු හා කුළුබඩු වැනි ආහාර බෝග වර්ග හඳුනා ගැනීම, ප්‍රචලිත කිරීම හා ප්‍රවර්ධනය කිරීම හරහා ප්‍රාදේශීය ආහාර හා පෝෂණ සුරක්ෂිතතාව ලබා කර ගැනීමට අපේක්ෂිත ය. තව ද, දේශීය දැනුම හා නවීන තාක්ෂණය මුසු කර ගනිමින් දළ ආහාර අපනයනය කරනු වෙනුවට අගය එකතු කළ ආකර්ශනීය ක්‍රියාකාරී ආහාර සැකසුම් නිෂ්පාදනය කර දේශීය, අපනයන හා දෙස් විදෙස් සංචාරක වෙළඳ ක්ෂේත්‍ර තුල භාවිතා කිරීම තුළින් විනිමය උත්පාදනයට විශේෂ අවධානයක් යොමු කරනු ඇත. ඒ හරහා වර්තමානයේ ආහාර ආනයනය සඳහා වාර්ෂිකව වැය කරන රුපියල් බිලියන 1,000 කට අධික විදේශ විනිමය ක්‍රමයෙන් රටට ඉතිරි කර ගැනීමට හැකි වේ. තව ද, අපට නොගැළපෙන ආහාර පරිභෝජනය නිසා ඇති වන සෞඛ්‍ය ගැටළු හා ඒ නිසා වැය වන සෞඛ්‍ය පිරිවැය අවම කර ගැනීමත් ණය බර අවම කිරීමත් කල හැකි වේ. මෙම ඉලක්ක සපුරා ගැනීම සඳහා ආහාර නිෂ්පාදන, අධ්‍යාපන, සෞඛ්‍ය, කර්මාන්ත හා වෙළඳ ක්ෂේත්‍රයන්ට අදාළ දෙස් විදෙස් විද්වතුන්, ව්‍යාපාරිකයන් හා ආහාර නිෂ්පාදකයන් සම්බන්ධීකරණය වන, අවශ්‍ය බලතල සහිත කාර්ය සාධන මෙහෙයුම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමට නියමිතයි. ඒ හරහා ප්‍රාදේශීය ආහාර සුරක්ෂිතතාවය හා ව්‍යවසායකත්වය පදනම් කර ගත් දැනුම, ආකල්ප හා කුසලතා ප්‍රවර්ධනය, ආහාර නිෂ්පාදනය, පර්යේෂණ, අභ්‍යන්තර හා අපනයන වෙළඳාම පිළිබඳ සියලු ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම සිදු කෙරේ. ඒ තුළින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන මූලික ක්‍රියාකාරකම් කිහිපයක් පහත දැක්වේ.

- වසර 1977 විවෘත ආර්ථිකය නිසා බිඳ වැටුණු, සත්ත්ව බල කෘෂිකාර්මික ගෘහ ආර්ථිකය නැවත ගොඩනැගීම
- යුරෝපයේ හා උතුරු ඇමරිකාවේ නිෂ්පාදනය කළ වියදම් අධික යන්ත්‍ර සූත්‍ර වෙනුවට ආසියාවේ නිෂ්පාදිත අඩු වියදම්, ගුණාත්මය ඉහළ තාක්ෂණික මෙවලම් හඳුන්වා දීම
- ප්‍රාදේශීය වශයෙන් වී ඇතුළු බීජ සංවර්ධන හා සංරක්ෂණ මධ්‍යස්ථාන ඇති කිරීම
- ග්‍රාමීය ගොවියාගේ වී සහ වෙනත් ධාන්‍ය වර්ග මිලදී ගැනීමටත්, ගබඩා කිරීමටත්, නැවත සකස් කොට ගැමියන්ට විකිණීමටත් ප්‍රාදේශීය මට්ටමෙන් මධ්‍යස්ථාන ඇති කිරීම
- සැම ගෙවත්තක්ම සරුසාර ආහාර හා අපනයන බෝග නිෂ්පාදන ඒකකයක් බවට පත් කරමින්, එහි ප්‍රතිඵල සෘජු ලෙස ගොවියාට ලැබෙන පරිදි ගෘහ ආර්ථිකය ශක්තිමත් කිරීම
- කිසිම කෘෂිකාර්මික ඉඩමක් නිවාස ඉඩමක් බවට පත් නොකරන අතර ඒ සඳහා රාජ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීම.

**4. රටට හිතැති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ස්ථාපිත කිරීම:**

දැනටමත් සංශෝධන 21 කින් සමන්විත වන 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනුවට ඉතාමත් සරල වූ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ප්‍රතිනිර්මාණය කිරීම. ඒ තුලින් පළාත් සභා ක්‍රමය අහෝසි කිරීමත්, මනාප ඡන්ද ක්‍රමය වෙනුවට මහජන නියෝජිතයා සිය ආසනයේ ජනතාවට වගකියන නියෝජන ක්‍රමයක් ස්ථාපිත කිරීමත්, පාර්ලිමේන්තු මැතිවරණය හා ජනාධිපතිවරණය එකම ඡන්දයක් තුලින් පැවැත්වීමත්, පාර්ලිමේන්තුවේ මැතිවරණ කොට්ඨාස මට්ටමින් පත්වන සංඛ්‍යාව 160 කට අඩු කිරිමත්පාර්ලිමේන්තු මන්ත්‍රී සංඛ්‍යාව 200 දක්වා අඩු කිරීම හා ආසන ගණන ඉක්මවා යන අතිරේක ධූර සංඛ්‍යාව (25) එක් එක් පක්ෂවලට ප්‍රකාශිත ඡන්ද සංඛ්‍යාව අනුව සමානුපාතිකව විද්වතුන්, වෘත්තිකයන් සහ විශේෂඥයන් පත්කිරිම අනිවාර්‍ය වන සේ සංශෝධනය කිරිම.

5. **නීතිය**:

නීතිය සෑම පුරවැසියෙකුටම සමානව ක්‍රියාත්මක කිරීම සඳහා අධිකරණ පද්ධතිය හා නීතිය සුරැකීමට අදාළ සියලු ම ආයතන ස්වාධීන ආයතන වශයෙන් ක්‍රියාත්මක කර වීම සඳහා වන ස්වාධීන කොමිෂන් සභා බල ගැන්වීම තුලින් දේශීය මෙන් ම විදේශීය රටවල පවා සඟවා ගත් අප සතු මුදල් විශුද්ධිකරණ පනත යටතේ නැවත අප රටට ලබා ගැනීම.

සැබෑ ශ්‍රී ලාංකීය ජාතියක් ගොඩනැගීමට අවහිරයක්ව පවතින සියලු ආගන්තුක පුද්ගල හා දේපල අහෝසි කොට ස්වදේශික හර පද්ධතියන්ට අනුකූල නීති පද්ධතියක් ඇති කිරිම.

**6. අධ්‍යාපනය:**

අධ්‍යාපනය සඳහා වෙන් කරන මූල්‍ය ප්‍රතිපාදන වැඩි කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරේ. දේශීය හා විදේශීය වෙළඳපොළට ගැළපෙන ආකාරයට වර්තමාන අධ්‍යාපන ප්‍රතිපත්තිය සංශෝධනය කිරිම. ඒ අනුව, අ.පො.ස සා.පෙ දක්වා පාසල් අධ්‍යාපනය අනිවාර්ය කිරීමත්, ඉන් පසු විශ්ව විද්‍යාලවලට ඇතුළු වන ශිෂ්‍යයන් හැර අනෙකුත් සියලු ම සිසුන් සඳහා අනිවාර්ය තාක්ෂණික හා වෘත්තීය පාඨමාලා හැදෑරීමට යොමු කිරිම තුලින් දේශීය හා විදේශීය ශ්‍රම වෙළඳපොළ කේන්ද්‍ර කර ගත් වෘත්තීය අභිමුඛ පාඨමාලා ලබා දීමටත් සියලු ම විශ්වවිද්‍යාල සිසුන් සඳහා ද දේශීය හා විදේශීය ශ්‍රම වෙළඳපොළ අරමුණු කර ගත් වෘත්තීය පාඨමාලා ආරම්භ කිරීමත් සිදු වේ. එමෙන්ම දේශීය ඛනිජ සම්පත් පදනම් කොටගත් කර්මාන්ත ආරම්භ කිරිම සඳහා සුදුසු තාක්ෂණික හා වෘත්තිය දැනුම ලබා දෙන විශ්ව විද්‍යාල ආරම්භ කිරීම.
දරුවන්ගේ අධ්‍යාපනය සුරක්ෂිත කිරීම වෙනුවෙන් රජය විසින් 'සුරක්ෂා' නමින් රක්ෂණ ආවරණයක් දියත් කිරීම.

7. **රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය**:

ජාතිවාදී වර්ගවාදී අර්බුද මුලින් උපුටා දමා ජාතීන් අතර සමගිය ඇති කිරීම වෙනුවෙන් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාසලෙහි ඉගැන්වීම අනිවාර්ය කිරීම සඳහා කටයුතු කරනු ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන අනුව සිංහල දෙමළ භාෂා සඳහා නිසි සැලකීම එලෙසින් ම පවතී.

උතුරු සහ නැගෙනහිර පළාත්වල ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් භාෂා විෂමතාව ඉවත් කිරිමත් ඕනෑම පුරවැසියකුට රටේ ඕනෑම තැනක ජීවත්වීමට ඇති අයිතිය පිළිගනිමින් සිංහල ජනතාවට උතුරු සහ නැගෙනහිර පදිංචි වීමටත් මනුෂ්‍යයකු වශයෙන් පරිපූර්ණ ජීවිතයක් භුක්තිවිඳිමට ඇති හිමිකම තහවුරු කිරිම.

8. **සැලසුම් හා ක්‍රම සම්පාදනය:**

රටේ තිරසාර සංවර්ධනය සඳහා අවශ්‍ය වන සැලසුම් හා ක්‍රම සම්පාදනය සඳහා සුදුසුකම් සහිත පුද්ගලයන්ගෙන් හා වෘත්තීය විශේෂඥයින්ගෙන් සමන්විත ස්වාධීන ජාතික ප්‍රතිපත්ති සැලසුම්

කොමිෂන් සභාවක් පත් කිරීම. බලයකට පත් වන කිසිම රජයකට අත්තනෝමතික ලෙස සැලසුම් වලින් අපගමනය විය නො හැකි සේ මෙම කොමිෂන් සභාවේ සකස් කරනු ලබන දිගු කාලීන සැලසුම් පාර්ලිමේන්තු පනත් මගින් සම්මත කර ගැනෙනු ඇති.

## 9. ශ්‍රම බලකාය:

රටේ වයස අවුරුදු 18 ට වැඩි සියලු ම පුරවැසියන් ශ්‍රම බලකාය ලෙස සලකන අතර ඔවුන්ගේ සියලු ම දත්ත පරිගණක ගත කර සේවා වියුක්තිය, ඌන සේවා නියුක්තිය හා සේවා නියුක්තිය පිළිබඳව පූර්ණ ලෙස විමසීමක් ඇති කොට ඔවුන් තමන්ගේ කුසලතා අනුව සේවා නියුක්ති කර වීම සඳහා ප්‍රමාණවත් පුහුණුවක් ලබා දීමත් ඔවුන්ගේ දත්ත පෞද්ගලික හා රාජ්‍ය සේවා සඳහා යොමු කිරීම තුලින් දේශපාලන බලපෑම් නොමැතිව සුදුසුකම් ඇති ඕනෑම කෙනෙකුට තමාගේ කැමැත්ත අනුව රැකියාවක් සොයා ගැනීමට අවශ්‍ය පහසුකම් සපයනු ඇත. මෙම කාර්ය සඳහා දැනට පවතින මානව සම්පත් සංවර්ධන කවුන්සිලය ප්‍රතිව්‍යුහගත කොට මෙම කාර්ය පවරනු ඇත.

## 10. සෞඛ්‍යය හා පෝෂණය

සෑම ජන කොට්ඨාසයකට ම සමාන සෞඛ්‍ය පහසුකම් හා පෝෂණය සැපයීම රජයේ මූලික වගකීම වේ. සෞඛ්‍ය සඳහා වෙන් කරන මුල්‍ය ප්‍රතිපාදන වැඩි කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරේ. විශේෂඥ වෛද්‍යවරුන්ගෙන් සමන්විත සියලු ම රජයේ රෝහල්වල සවස 04 න් පසු චැනල් සේවාවක් ආරම්භ කරන අතර ඉන් ජනිත වන අරමුදල් කොටසක් වෛද්‍යවරුන්ට හා සේවය සපයන සේවකයන්ට ද, අනෙක් කොටස එම රෝහලේ රෝහල් සංවර්ධන අරමුදලට ද බැර කරනු ඇත. ඒ අනුව, රෝහලේ එදිනෙදා නඩත්තු කටයුතු හා හදිසි උපකරණ මිල දී ගැනීම් රෝහල් මට්ටමින් ඉටු කර ගැනීමට එම රෝහල් වලට හැකි වනු ඇත. බටහිර, දේශීය හා ආයුර්වේද වෙදකම් සඳහා සම තැන දී කටයුතු කරනු ලබන අතර බෙයිජින් සම්මුතිය අනුව මහජනතාවට වඩාත් සමීප සහ දැරිය හැකි වෛද්‍ය ක්‍රමය ලෙස ස්වදේශික වෛද්‍ය ක්‍රමය ප්‍රවර්ධනය, නියාමනය සහ සංරක්ෂණය සඳහා සිංහල වෙද සභාවක් අනන්‍ය වෛද්‍ය කේෂේත්‍රයක් ලෙස ස්ථාපනය කිරීම. මේ අනුව, රටට ගැළපෙන ප්‍රතිපත්තීන් වෛද්‍ය ක්ෂේත්‍රයේ ස්ථාපිත කරන අතර විශේෂයෙන්ම මහාචාර්ය සේනක බිබිලේ ගේ ඖෂධ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු ඇත. මේ තුලින් මහජනතාවට අනවශ්‍ය ලෙස ඖෂධ ශාලාවලින් මිල දී ගන්නා ඖෂධ සඳහා ඉහළ මිලක් ගෙවීමට සිදු නො වෙනු ඇත.

## 11. වාරි කර්මාන්තය හා ජල පිටාර ගැලීම් පාලනය:

මහ වාරි කර්මාන්තවලට අදාළ ජලාශ පද්ධතියෙහි ජල පෝෂක ප්‍රදේශ සංරක්ෂණය කිරීම. මේ සඳහා මධ්‍යම කඳුකරය ඇතුළු සියලුම කඳු මුදුන් වල අහිතකර ෆයිනස් වගාව ඉවත් කොට කොස්, පලතුරු, සාදික්කා, එනසාල්, කරාබු නැටි, ගොරකා වැනි දේශීය ශාක මෙන්ම අත්‍යාවශ්‍ය සුදුසු ශාක සහිත යටි වගාවක් ද වගා කිරීම අප රජයේ මුඛ්‍ය පරමාර්ථය වේ. මේ තුලින් රිළව්, වඳුරන් වැනි වන සතුන්ට එම ප්‍රදේශවල ආහාර සුලභ වීම නිසා ගම් වලට වැදී වගා හානි කිරීමට ඇති අවස්ථාව අඩු වනු ඇත. මධ්‍යම හා කුඩා වැව් සහ ඇලවල් සියල්ල ප්‍රතිසංස්කරණය කිරීමත්, ගංගා ඉවුරු සංරක්ෂණය කිරීමත් සිදු වනු ඇත.

## 12. පරිසර සංරක්ෂණය හා වන වගාව:

අ.පො.ස සා.පෙ දක්වා සිසුන්ට පරිසර අධ්‍යාපනය පරිසර සංරක්ෂණ හා ඒ සම්බන්ධ නීති රීති පිළිබඳ අවබෝධයක් අනිවාර්යයෙන් ලබා දිය යුතු වේ. මේ සම්බන්ධ අලුතින් විෂය නිර්දේශයක් ඇති කිරීම සුදුසු වේ. එමෙන්ම, රටේ භූමි භාගයේ ප්‍රතිශතයට අනුව නැවත වන වගාව ස්ථාපිත කිරීමත් ගෝලීය කාලගුණ විපර්යාස වලට මුහුණ දීම සඳහා මධ්‍යස්ථානයක් (Climate change combat center) ස්ථාපිත කිරීමත් සිදු කල යුතු වේ. කොස් ගස මෙරට මව් ශාකය ලෙසත් පොල් ගස මෙරට පිය ශාකය ලෙසත් හඳුන්වා දෙන අතර ලංකා භූමියේ ඉඩකඩ ඇති සෑම තැනකම මෙම

ශාක දෙක වගා කිරීම කල යුතු අතර ඒ සඳහා දිරි දීම කල යුතු ය. භූමිය ලබා ගත හැකි සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම අක්කර දහයක්වත් ආදර්ශමත් රක්ෂිත වන වගාවක් ලෙස ස්ථාපිත කල යුතු වේ. මෙම වන වගාව තුල ඉහත අංක 11හි සඳහන් ශාක ඇතුළු ඒ ඒ පළාත්වලට ගැළපෙන ශාක ප්‍රජාව මෙන් ම ශාක හා සත්ව ප්‍රජාව සඳහා අවශ්‍ය ජල ප්‍රභව ද නිර්මාණය කෙරේ.

## 13. ආගමික:

අප ආණ්ඩුක්‍ර ව්‍යවස්ථාවේ සියලුම ආගම් සඳහා සපයා ඇති සියලු අයිතිවාසිකම් එලෙසින්ම ආරක්ෂා කරන අතර බුදු දහමට ප්‍රමුඛතාවය දෙමින් බුද්ධ ශාසනය ආරක්ෂා කොට ප්‍රවර්ධනය කිරීම සහ සියලුම ආගම් හා ඔවුන්ගේ සංස්කෘතීන් අතර සහජීවනය ඇති කිරීම පිණිස සුදුසු වන ක්‍රියාමාර්ග ගැනීම. දැනට පිරිවෙන් අධ්‍යාපන පනතේ අරමුණු සාක්ෂාත් කරනු වස් දේශ දේශාන්තර වල බුදු දහම ප්‍රචාරය කිරීම පිණිස අප තානාපති සේවයේ පූර්ණ සහය ලබා දෙන අතර මේ සම්බන්ධයෙන් හැකියාව ඇති භික්ෂූන් වහන්සේලාට විදේශ භාෂා ඉගෙන ගැනීමටත්, ධර්ම දේශනා පැවැත්වීම සඳහා සංචාරය කිරීමටත් ඒ සඳහා මූල්‍ය පහසුකම් සැපයීමටත් රජය කටයුතු කරනු ඇත.

## 14. ජාතික උරුමයන් සහ අස්පර්ශනීය අයිතීන්

උතුරු සහ නැගෙනහිර ඇතුළු රටේ සියලුම ප්‍රදේශවල රටේ සියලු ජාතික උරුමයන් රටේ ඓතිහාසික අනන්‍යතාව රැකෙන පරිදි ආරක්ෂා කිරිම.

පාරම්පරික ඥාණය සහ තාක්ෂණය ආරක්ෂා කිරිම සහ සංරක්ෂණය කිරිම සඳහා අධ්‍යාපනය විෂයන් සඳහා එම ක්ෂේත්‍ර ඇතුල් කිරිම සහ සංරක්ෂණ ක්‍රමවේදයන් ඇතිකිරිම.

## 15. විදේශ ප්‍රතිපත්තිය:

ශ්‍රී ලංකාවේ ආර්ථික සහ ආරක්ෂක අභිලාශයන්ට අනුකූලව විදෙස් රටවල් සමඟ නොබැඳි හා නො බිඳුනු ප්‍රතිපත්තියක් අනුගමනය කරනු ඇති අතර සාම්ප්‍රදායික රාජ්‍ය සම්බන්ධතා වලින් ඔබ්බට යුරෝපය, නැගෙනහිර යුරෝපය සහ ආසියාතික රටවල් සමග සමීප ආර්ථික දේශපාලන සහ සංස්කෘතික සබඳතා ඇති කිරිම.
. රට ජාතියට ඇලුම් කරන විදේශ තානාපති සේවයක් ඇති කරන අතර මෙම තානාපතිවරුන්ගේ වාර්ෂික කාර්ය සාධන ඇගයීම පහත සඳහන් ක්‍රියාකාරීත්වයන් මත කරනු ඇත.

- තමා සේවය කරන රටෙහි අප රට සම්බන්ධයෙන් ඇති ආකල්පය ඉතාමත් සීරුවෙන් සොයා බලා එම රටෙහි අප කෙරෙහි ශුභවාදී ආකල්ප ඇති කිරීම සඳහා අවශ්‍ය සියලුම කටයුතු ඉටු කිරීම.
- අප රටෙහි සංචාරය පිණිස පිටරටියන් පෙළඹවීමත් ඒ සඳහා අප රටෙහි සංචාරයෙහි වැදගත් කම හුවා දක්වන සියලුම තොරතුරු සැපයීම හා සංචාරය ප්‍රවර්ධන කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම
- විදේශ රැකියාවල නියුතු අප රටියන් පිළිබඳ සොයා බැලීම, ඔවුන්ගේ ප්‍රශ්න වලට විසඳුම් ලබා දීම, ඔවුන් සුරක්ෂිතව රැකබලා ගැනීම හා විදේශ සේවා නියුක්තිය සඳහා වන අවස්ථා ප්‍රවර්ධනය කර අප රජය දැනුවත් කිරීමත් කල යුතු වේ. මේ සඳහා දේශපාලන ගැත්තන් නොවන රට ජාතියට ආදරය කරන විදේශ තානාපති සේවයක් ස්ථාපිත කිරීම සඳහා අප රජය කටයුතු කරන අතර තානාපති සේවයේ සිටින සියලුම දෙනාගේ ආකල්ප සහමුලින්ම වෙනස් කොට අප රටේ දියුණුව සඳහා වන ශුභවාදී ආකල්ප ඇති කල යුතු වේ.

## 16. ජාතික ආරක්ෂාව:

ජාතික ආරක්ෂාව සඳහා බලපාන උපායමාර්ගික ස්ථාන සහ ව්‍යාපාර වල රාජ්‍ය හිමිකාරත්වය තහවුරු කිරිම.

රාජ්‍ය ආරක්ෂාව සහ ආර්ථික ස්වාධිපත්‍යයට අහිතකර ලෙස බලපාන සියලු ගිවිසුම් අහෝසි කිරීම.

රටේ ජාතික ආරක්ෂාව සුරක්ෂිත කිරීම සඳහා ත්‍රිවිධ හමුදාව හා පොලිසිය ඇතුලත්ව අතිවිශිෂ්ඨ බුද්ධි සේවාවක් ස්ථාපිත කිරීමත්, දේශපාලන බලපෑම් වැලින් තොර ව මෙම සේවාවල බඳවා ගැනීම් හා කාර්ය සාධන මැනීම මත පදනම් වූ උසස් වීම් ක්‍රමයක් ස්ථාපිත කරනු ඇත.

මවුබිමේ ඒකීයබව වෙනුවෙන් ජීවිත පරිත්‍යාගයෙන් සටන් කල රණවිරුවන්ට එරෙහිව පනවන ලද සියලු අණපනත් අහෝසි කිරීම, විදේශීය මැදිහත් වීම් ප්‍රතික්ෂේප කිරීම සහ ආබාධිත රණවිරුවන්, මියගිය රණවිරුවන් හා ඔවුන්ගේ පවුල්වල ඥාතීන්ගේ සුබසාධනය වැඩි කිරීම.

ත්‍රිවිධ හමුදාව හා පොලීසිය ඒකාබද්ධව අප රටට අයිති සාගර හා ගුවන් කලාපය ආරක්ෂා කෙරේ. මෙම වැඩ පිළිවෙල ග්‍රාමීය මට්ටමේ සයයෝගයෙන් ශක්තිමත් කිරීම පිණිස 'සාම ග්‍රාම' වැඩ පිළිවෙල ස්ථාපිත කරන අතර සෑම ගමක් සම්බන්ධයෙන්ම ජාතික ආරක්ෂාවට බලපාන තොරතුරු, මත්ද්‍රව්‍ය හා මත්පැන් භාවිතය පිළිබඳ තොරතුරු, ජාතික ආරක්ෂාවට හානි වන නීතිවිරෝධී සංවිධාන පිළිබඳ තොරතුරු හා මහජන ආරක්ෂාව සඳහා අදාළ වන සියලු ම කටයුතු සිදු කිරීම.

## 17. ළමා, කාන්තා, යෞවන හා ජ්‍යෙෂ්ඨ පුරවැසි කටයුතු:

- ළමයි (උසස් පෙළ දක්වා) වයස අවුරුදු 18 ට අඩු ජනගහනය ළමා ජනගහනය ලෙස සැලකෙන අතර එම දරුවන්ගේ පෝෂණය, ආරක්ෂාව, සුරක්ෂිත බව, හා මානසික වර්ධනය සහතික කිරීම පිණිස ළමා අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම
- සියලුම කාන්තාවන්ගේ සුරක්ෂිත බව මානසික සංවර්ධනය, පෝෂණය, හා අධ්‍යාපනය සුරක්ෂිත කිරීම පිණිස කාන්තා හා අයිතිවාසිකම් පිළිබඳ සියලුම අනපනත් හා ප්‍රඥප්ති ක්‍රියාත්මක කිරීම
- යෞවනයන් සඳහා රජයේ ආකර්ශනීය දීමනාවක් සහිතව නේවාසික නායකත්ව පුහුණු පාඨමාලාවක් ඇති කිරීම, ඔවුන් අතර සහයෝගිතාව වර්ධනය කිරීම, ඔවුන්ගේ අවශ්‍යතා අයිතිවාසිකම් පිළිබඳ දැනුවත්ව කටයුතු කිරීම සහ අංක 09 සඳහන් දත්ත ගබඩාවට අනුව රැකියා සේවය සලසනු ඇත.
- වයස අවුරුදු 60 ට වැඩි රට වෙනුවෙන් කැප වුනු සියලුම ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා සෞඛ්‍ය, පෝෂණ හා ආරක්ෂාව සඳහා වන ක්‍රියාකාරී වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කරනු ඇත. ඒ අනුව ඔවුන්ගේ ආර්ථිකය සුරක්ෂිත කිරීම සිදු කෙරේ. විශ්‍රාම ලැබූ හා වැන්දඹු ආධාර ලබන සෑම ජ්‍යෙෂ්ඨ පුරවැසියකුටම වැඩි වන ජීවන වියදමට සමානුපාතිකව විශ්‍රාම වැටුපට දීමනාවක් එකතු කරනු ඇත. මෙම විශ්‍රාමිකයන් ගේ රජයේ සේවයට විශේෂ දායකත්වයක් අවශ්‍ය වන විට ඔවුන්ට ඒ සඳහා දීමනාවක් ලබා දීමෙන් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් ගේ සේවය රාජ්‍ය සේවයට නැවත ලබා ගත හැකි වේ.

## 18. රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු:

රාජ්‍ය පරිපාලනය රටට ගැළපෙන ආකාරයට විධිමත්ව සංශෝධනය කිරීමටත්, පරිපාලන නිලධාරින් ගේ හැකියාවන් ඇගයීම සඳහා ක්‍රම වේදයක්(Performance Appraisal System) සකස් කිරීමත්, කාර්ය සාධන ඇගයීම්වලට ලක් කොට ඔවුන්ට අදාළ උසස් වීම් ලබා දීමත්, වැටුප් විෂමතා ඉවත් කර සාධාරණ වැටුප් ව්‍යුහයක් ඇති කිරීමත් සඳහා වැටුප් කොමිෂන් සභාවක් ස්ථාපිත කරනු ලැබේ.

සියලු ම රාජ්‍ය සේවකයන්ගේ හා විශ්‍රාමිකයින්ගේ වැටුප් හා විශ්‍රාමික දීමනා වල ඇති විෂමතා ඉවත් කොට සාධාරණ වැටුප් ව්‍යාවුහයක් සකස් කිරීම සඳහා ජාතික වැටුප් කොමිෂන් සභාවේ සහයෝගය ලබා ගැනේ.

රාජ්‍ය සේවයේ පත් කිරීම සඳහා තරඟ විභාග ක්‍රමය අනුගමනය කරන අතර දේශපාලන මැදිහත් වීම් සහමුලින්ම ඉවත් කෙරේ. රාජ්‍ය සේවයේ පුරප්පාඩු නොමැතිව විදිමත් ව බඳවා නොගෙන දේශපාලනඥයින්ගේ අවශ්‍යතා පරිදි අනියම් පත්වීම් ලබා දීම අත්හිටුවනු ඇත.

#KW

සියලුම ප්‍රාදේශීය ලේකම් කාර්යාල පළාත් පාලන සභා සමඟ සහයෝගයෙන් වැඩ කිරීමට විධිවිධාන සලස්වන අතර මහජනයාගේ රාජ්‍ය සේවා අවශ්‍යතා ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුලින් ඉටු කර ගැනීම තව දුරටත් ශක්තිමත් කරනු ඇත. ඒ අනුව ග්‍රාම රාජ්‍ය ක්‍රමය ශක්තිමත් කිරීම පිණිස ප්‍රාදේශීය රාජ්‍ය සභා ව්‍යුහයක් ස්ථාපිත කරනු ලැබේ. මධ්‍යම රජයේ හැකි සියලුම කටයුතු ප්‍රාදේශීය රාජ්‍ය සභා ක්‍රමයට විමධ්‍යගත කිරීම තුලින් මහජනයාට තම සියලුම කටයුතු අගනගරයට නොපැමිණ ඉටුකර ගනීමට හැකි වේ.

## 19. රාජ්‍ය සේවයේ සහ දේශපාලනය තුල වගවීම, වගකීම සහ වෘත්තිය ගරුත්වය ආරක්ෂා කිරීම:

දේශපාලඥයන් සහ රාජ්‍ය සේවකයන්ට එම තනතුරු සම්බන්ධයෙන් වගවීම සහ වගකීම තහවුරු කරන මහජන ගෞරවය ආරක්ෂා කරන නීතියෙන් බලාත්මක කල හැකි ආචාර ධර්ම පද්ධතියක් හඳුන්වාදීම සහ ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන විශේෂ විනිශ්චය සභාවක් හඳුන්වා දීම.
අමාත්‍යාංශවල සහ රාජ්‍ය ආයතනවල සියලු ක්‍රියාවලීන් අධි ආරක්ෂිත පරිගණකගත පද්ධතිවලට අනුගත කිරීම සඳහා සැලසුම් සකස් කොට ක්‍රියාත්මක කිරීම.

## 20. සංචාරක ක්ෂේත්‍රය :

සංචාරක ක්ෂේත්‍රය දිරිමත් කිරීම සඳහා සියලුම හෝටල් සහ කුඩා පරිමාණ ලැගුම් හල් සියල්ලම සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි විය යුතු අතර ප්‍රමිතියන්ට අනුව ක්‍රියාත්මක විය යුතු වේ.
ලංකාව තුල සංචාරය කිරීමට සුදුසු සියලුම ස්ථාන පිළිබඳ තොරතුරු ආකර්ශනීය ලෙස සකස් කොට දෙස් විදෙස් වල ප්‍රචාරය කිරීම. මේ සඳහා විදේශ තානාපති සේවාවන් ගේ සේවය ලබා ගත යුතු වේ. වර්තමානයට ගැළපෙන ලෙස Wellness, Echo, Agro, Sports යන සංචාරක ක්ෂේත්‍රයන් ජනප්‍රිය කිරීම සඳහා ඊට අදාළ ස්ථාන වල පහසුකම් වැඩි දියුණු කිරීම හා ඒ සඳහා පුළුල් ප්‍රචාරණයක් ලබා දීම කල යුතු වේ.
විදෙස් රට වලට නුපුහුණු ශ්‍රමය මෙහෙකාර සේවය සඳහා යවනවා වෙනුවට ඔවුන් සඳහා වැඩිහිටියන් රැක බලා ගැනීමේ විශේෂ පුහුණුව ලබා දීමෙන් පසු ශ්‍රී ලංකාව තුල අප විසින් ස්ථාපිත කිරීමට බලාපොරොත්තු වන විදේශීය විශ්‍රාමිකයින් රැක බල ගන්නා හා ආයුර්වේද ප්‍රතිකාර ලබන මධ්‍යස්ථානවල සේවයට යෙදවීමෙන් සංචාරක ක්ෂේත්‍රයේ නව අංශයක් හඳුන්වා දෙන අතර මෙම ක්ෂේත්‍රයේ විදේශ සේවා වලට යන අයට ඉහල වැටුපක් ලබා ගෙන මෙරට දීම තම රැකියාව කල හැකි වනු ඇත.
විදේශ සංචාරකයන්ගේ ආරක්ෂාව හා ඒ සම්බන්ධ පැමිණිලි ගැන ක්‍රියා කරනු වස් පොලීසියේ සංචාරක ආරක්ෂක අංශය යනුවෙන් වෙනම අංශයක් ස්ථාපිත කිරීම.

## 21. බදු ක්‍රමය:

ජාතික අවශ්‍යතාවය අනුව බදු සංශෝධනය කිරීම, ජනතාවට තමාගේ ඉපයීම මත පදනම් වූ සරල බදු ක්‍රමයක් ඇති කිරීම.
ආහාර, ඖෂධ, ඇඳුම් පැළඳුම් හා නිවාස යන අත්‍යාවශ්‍ය මූලික අවශ්‍යතා සඳහා බදු සහන ලබා දීම. දේශීය නිෂ්පාදන සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය හා යන්ත්‍රෝපකරණ සඳහා ඇති ආනයනික බද්ධ අවම වන ආකාරයට සංශෝධනය කිරීම.
අතීතයේ බදු පැහර හැරීම් නීතිය ඉදිරියට ගෙනවිත් එම බදු නැවත අය කර ගැනීම. අප රජයක් යටතේ මූලික අවධානය යොමු කරන්නේ ජනතාව මත බදු බර පැටවීම වෙනුවට අපනයනය මගින් ආර්ථිකය සංවර්ධනය කර ආදායම් ලබා ගැනීම තුළින් අධික බදු බර කපා හැරීමයි.

### ප්‍රමිතිකරණය හා මිල නියාමනය:

සියලුම නිෂ්පාදන භාණ්ඩ හා පරිභෝජන භාණ්ඩ ලංකාවට ගැළපෙන ආකාරයට ප්‍රමිතිකරණයට ලක් කිරීම, සාධාරණ වෙළඳ කොමිෂන් සභාවක් ස්ථාපිත කිරීම තුළින් දේශීය මෙන්ම ආනයනික භාණ්ඩවල මිල සාධාරණ දැයි පරීක්ෂා කර මිල පාලන ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම. මේ තුලින්

භාණ්ඩ ආනයනය කර අසාධාරණ ලෙස මිල ඉහල දමා වැඩි මිලට භාණ්ඩ විකුණා පාරිභෝගිකයින් සූරා කෑම අත්හිටුවනු ලැබේ. ප්‍රමිතිකරණ ආයතන හා කොමිෂන් සභාව සම්පූර්ණයෙන්ම දේශපාලන බලපෑම් වලින් ඉවත් කරනු ලැබේ.

## 22. සංවර්ධන බැංකු හා මූල්‍යායතන:

සියලුම බැංකු හා මූල්‍යායතන මහ බැංකුවේ පූර්ණ නියාමනයට භාජනය වන අතර මෙතුලින් අනාරක්ෂිත මූල්‍යායතනවල ගනුදෙනු කරුවන්ගේ මුදල් තැන්පතු නිතැතින්ම ආරක්ෂා කල යුතු වේ. සියලුම බැංකු විසින් සාධාරණ ආකාරයට බැංකු වල ලාභ උපරිම කිරීමේ පරමාර්ථය වෙනුවට ජනතාවට උපරිම සේවයක් සලසනවා යන පරමාර්ථය ඇතිව ණය පොලී අනුපාත සහන මට්ටමකට ගෙන එම කළ යුතුය. තැන්පතු හා ස්ථිර තැන්පතු වලට සාධාරණ ඉහළ පොලියක් ලබා දිය යුතු අතර වයස අවුරුදු 60 ඉක්මවන ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා ඔවුන්ගේ ආර්ථිකය සුරක්ෂිත කරලීමට සුදුසු වන ඉහලම ඉතුරුම් පොලී අනුපාතයක් යම්කිසි උපරිම තැන්පත් මුදලක් දක්වා ගෙවිය යුතු වේ.
සංවර්ධන බැංකු එක් එක් ක්ෂේත්‍රයක් සඳහා ස්ථාපිත කල යුතු අතර ඔවුන්ගේ මූලික අරමුණ විය යුත්තේ කර්මාන්ත කරුවන් සඳහා අඩු පොලී ප්‍රතිශතයකට පොලී සහන කාලයක් (grace period) සහිතව සංවර්ධන ණය ලබා දීමයි. මෙම බැංකු සඳහා මූල්‍ය ණය විදේශ සහයෝගීතා ආයතන ඔස්සේ ලබා ගන්නා අඩු පොලී සහිත මූල්‍යාධාර වලින් සපයා ගත හැකි වේ.

## 23. සමූපකාර ක්‍රමය හා ව්‍යවසාය සංවර්ධනය :

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය සඳහා මූලික වශයෙන් සමූපකාර ක්‍රමයත්, ජනතා සමාගම් ක්‍රමයත් ස්ථාපනය කිරීම හා ප්‍රචලිත කිරීම ක්‍රියාත්මක කරනු ඇත. මෙම ආයතන සඳහා අවශ්‍ය ණය පහසුකම් අඩු පොලී අනුපාත වලට යටත්ව ඉහත සඳහන් සංවර්ධන බැංකු පද්ධතිය හරහා ලබා දෙනු ලැබේ. දැනට ඉතා අල්ප වශයෙන් භාවිතා කරන විශාල මුදලක් ඇති සමූපකාර සංවර්ධන අරමුදල මෙම ව්‍යවසාය සමූපකාර සමිති සඳහා ආරම්භක මූලධනය සහ ක්‍රියාකාරී ප්‍රාග්ධනය සහන පොලියකට ලබා දීම පිණිස යොදා ගැනීමට පුළුවන. මේ තුලින් ගොවියාත් පාරිභෝගිකයාත් අසාධාරණ සූරා කෑමෙන් වළක්වා ගත හැකි වේ.

රාජ්‍ය හා පෞද්ගලික ආයතන පිටරටට විකුණා දැමීම වෙනුවට ජනතා සමාගම් ව්‍යුහයක් තුළින් එහි කොටස් දෙස් විදෙස් ශ්‍රී ලාංකිකයන්ට මිලදී ගැනීමට සැලැස්වීමටත්, 10% කොටස් එම ආයතනවලට ඉහළ සේවාවක් සැපයූ සේවකයන් සඳහා වෙන් කිරීම තුළින් ඔවුන්ගේ ආදායම් තත්ත්වය ඉහළ දැමීමටත් අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.

## 24. ධීවර, ජලජ සම්පත් හා සාගර ඛනිජ සම්පත්

සමූපකාර, ජනතා සමාගම් යන ක්‍රම භාවිතා කරමින් මත්ස්‍ය සම්පත ප්‍රශස්ත ආකාරයෙන් ලබා ගැනීමට කටයුතු කෙරේ. මේ සම්බන්ධයෙන් වූ නීති රීති තදින්ම ක්‍රියාත්මක කරනු ලැබේ, ධීවර බෝට්ටු මහා පරිමාණ ට්‍රෝලර් මිලදී ගැනීම සඳහා සංවර්ධන බැංකු ඔස්සේ සහන මිලට මූල්‍ය පහසුකම් ලබා දෙනු ඇත.

දැනට භාවිතා නොකරන සාගරයේ සැඟවී ඇති ඛනිජ සම්පත් ඛනිජ නිධි යනාදිය පිළිබඳ පර්යේෂණ කිරීම සඳහා සහ ඒ සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්ති රජයට නිර්දේශ කිරීම සඳහා වන සාගර සම්පත් ගවේෂණය පිළිබඳ විශේෂ මෙහෙයුම් ආයතනයක් පිහිටුවනු ලැබේ.
දැනට පිහිටුවා ඇති සාගර විශ්වවිද්‍යාලය ජාත්‍යන්තර සම්බන්ධතා හා සහයෝගීතාව මත ඉහත ක්ෂේත්‍රයන් සඳහා වන අන්තර්ජාතික විශ්වවිද්‍යාලයක් මට්ටමට ගෙන ඒමට කටයුතු කල යුතු වේ. උදාහරණයක් ලෙස ගැඹුරු මුහුදු ගවේෂණ නාවික ඉංජිනේරු විද්‍යාව වැනි සියලු කටයුතු මෙම ආයතනය මගින් සිදු කෙරේ. නාරා වැනි පර්යේෂණ ආයතන මෙම විශ්ව විද්‍යාල සමඟ ඒකාබද්ධ කල යුතු වේ.

"ඉසුරු පිරුනු හෙටක් - රටට සුහුරු හෙටක්”



කීර්ති වික්‍රමරත්න
கீர்த்தி விக்கிரமரத்ன
Keerthie Wickramaratne

Read More